දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය විසින් ඒ සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුත්තේ, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ හැකියාවක් ඇති බැවිනි. සමාජයේ ජනප්‍රියත්වයක් උසුලන අයෙකුගේ දිවි තොර කරගැනීමක් වාර්තා කිරීමේදී මාධ්‍ය දැඩි ප්‍රවේසම් සහගත බවක් අනුගමනය කළ යුත්තේ, එවැනි අවස්ථාවක අනුකාරක දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ අවදානම සැලකිය යුතු ලෙසින් ඉහළ යන බැවිනි.
ඊට උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකා මීටර් 400 කඩුලු මතින් දිවීමේ ශූරිය, අප්‍රේල් 24, 2022 දින මිය යෑම සම්බන්ධ පුවත ගත හැක. එය අප්‍රේල් 24 දින රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් තුළ සහ, අප්‍රේල් 25, 2022 දින තෝරාගත් සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී තිබූ ආකාරය සහ එහිදී මාධ්‍ය මාර්ගෝපදේශයන් උල්ලංඝනය වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.
එසේම, ඇතැම් පුවත්පත්, දිවි තොරකර ගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය ආචාරධර්මයන්ට වඩාත් අනුකූල වන අයුරින්, මෙම සිදුවීම දිවි තොර කරගැනීමේ පුවතක් බවට හැඟී නොයන ආකාරයෙන් වාර්තා කර ඇති බවද සඳහන් කළ යුතු වේ. එම පුවත් වාර්තාවන් සමගින් උපකාරක අංකද සඳහන් වූයේ නම් එය වඩාත් යෝග්‍ය වේ.
එසේ නම්, මෙම පුවත, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම් පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට වඩාත් අනුකූල වන ලෙසින් වාර්තා කිරීමේ හැකියාවක් අනෙක් මාධ්‍යයන්ට නොතිබුණි ද?
ඔබේ අදහස?
(මෙම දත්ත සටහන සඳහා භාවිතා වී ඇත්තේ අප්‍රේල් 24, 2022 රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් පමණක් බවත්, වෙනත් වේලාවන් හි විකාශය වන පුවත් ඇතැම් විටක මෙම දත්ත වලට වඩා වෙනස් විය හැක. එසේම එදින සිලෝන් ටුඩේ පුවත්පත සඳහා ප්‍රවේශය නොතිබූ බවද කරුණාවෙන් සලකන්න.)
හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...